දුරකථන:
**தொலைபேசி**
Telephone:
සභාපති
**தலைவர்**
Chairman: (+94) 011 2556840

ලේකම්
**செயலாளர்**:
Secretary: (+94) 011 2556831

කාර්යාලය
**காரியாலயம்**
Office: (+94) 011 2556834
011 3071324

ෆැක්ස්:
**தொ.நகல்**
Fax (+94) 011 2556836
011 2556837

විද්‍යුත් තැපැල
**மின்னஞ்சல்**:
e-mail fincom@sltnet.lk

# මුදල් කොමිෂන් සභාව

( ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154'ජ' ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී.)

# நிதி ஆணைக்குழு

**(அரசியலமைப்பின் 154`எ ஆம்உறுப்புரையின்கீழ் தாபிக்கப்பட்டது)**

**FINANCE COMMISSION**
**(Established under Article 154 R of the Constitution)**

48, වජිර පාර,
කොළඹ 04.

48,**வஜிரா வீதி,**
**கொழும்பு**-04,**இலங்கை**.

48,Vajira Road,
Colombo 04, Sri Lanka.

මගේ අංක
**எனது இல**:
My No FC/3/3/2015

ඔබේ අංක
**உமது இல**:
Your No

දිනය
**திகதி**:
Date 2015.03.25

**මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 2015/01**

ප්‍රධාන ලේකම්

බස්නාහිර/ මධ්‍යම/ දකුණු/ උතුරු/ නැගෙනහිර/ වයඹ/ උතුරු මැද/ ඌව/ සබරගමුව පළාත

**<u>ප්‍රාග්ධන අරමුදල් යටතේ පළාත්වල වාර්ෂික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පිළිපැදිය යුතු පටිපාටි</u>**

මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් 2015 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය. ඒ අනුව, මුදල් කොමිෂන් සභාව විසින් මෙයට පෙර නිකුත් කර ඇති මෙම විෂයයට අදාල අංක FC/PSDG&CBG/Circular/2011/1 දරන 2011.07.26 දිනැති චක්‍රලේඛය හා අංක FC/PRP/C/2012 හා FC/3/3/2013 දරන 2012.05.16 හා 2013.07.26 දිනැති ලිපි මගින් එම චක්‍රලේඛයට සිදු කරන ලද සංශෝධනයන් සියල්ල 2015 අප්‍රේල් 01 දින සිට අවලංගු වේ.

මෙම නව චක්‍රලේඛය පිළියෙල කිරීමේදී පළාත්වල හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ලබා දුන් යෝජනාද සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව, ප්‍රාග්ධන අරමුදල් යටතේ පළාත්වල වාර්ෂික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පහත කරුණු අනුගමනය කළ යුතු වේ.

## 1. ඉදි කිරීම් කටයුතු

### 1.1. ගොඩනැගිලි ඉදි කිරීම

මුදල් කොමිෂන් සභාව විසින් ලබා දී ඇති උපදෙස් අනුව පළාත් සභා විසින් පිළියෙළ කර මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබාගත් වාර්ෂික සංවර්ධන වැඩසටහන් තුළ අන්තර්ගත වන ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු සම්බන්ධයෙන් ඇස්තමේන්තු සැකසීමේදී, අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ඉංජිනේරුවන් හා කාර්මික නිලධාරීන් එම ඉදිකිරීම් අවශ්‍යතාවයට ගැලපෙන බවට හා ඇස්තමේන්තුගත මුදල සාධාරණ බවට වගබලා ගත යුතුය. එමෙන්ම සෞඛ්‍ය, අධ්‍යාපන හා අනිකුත් අංශවලට අදාල මධ්‍යම රජයේ ආයතනයන් විසින් ගොඩනැගිලි ඉදිකිරීමේදී දැනට රජය පිළිගෙන ඇති අනුමත ගොඩනැගිලි සැලසුම් (Type Plan)

අනුගමනය කළ යුතුය. එසේ වුවද, මනා සාධාරණීකරණයක් කිරීම තුළින්, අනුමත ගොඩනැගිලි සැලසුම් අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි සංශෝධනය කර ගත හැකිය.

තවද, කිසියම් ඉදිකිරිමක් කොටස් වශයෙන් නිම කිරීමට අපේක්ෂිත නම්, සමස්ත ඉදිකිරීම සම්බන්ධයෙන් ඇස්තමේන්තුවක් සකසා ඉන් පසු කොටස් වශයෙන් නිම කළ යුතු වේ. අපේක්ෂිත සමස්ත ඉදිකිරීම සැලසුම් කළ පසු පළමුව එම සමස්ත සැලසුමට සහ මුළු පිරිවැයට, අපේක්ෂිත කොටස් සංඛ්‍යාවට අනතුරුව එක් එක් කොටසේ වියදම් ඇස්තමේන්තුවට මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගත යුතුය. ඉන් පසුව පළමු කොටසේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතුය. සෑම කොටසක් අවසානයේදීම එම අවසන් කරනු ලැබූ කොටස ප්‍රතිලාභීන්ගේ ප්‍රයෝජනය සඳහා යෙදවිය හැකි විය යුතුය. එසේ නොවන ඉදිකිරීම් කොටස් වශයෙන් වෙන් නොකළ යුතුය. නොවැළැක්විය හැකි හේතුවක් මත කිසියම් ඉදි කිරීමකට අමතර වැඩ ඇතුළත් කළ යුතු නම්, ඒ සම්බන්ධයෙන් මනා සාධාරණීකරණයක් ඉදිරිපත් කළ යුතු වේ. එසේම, එම අමතර වැඩ ඇතුළත් කිරීම මගින් ඇස්තමේන්තුගත මුදල ඉහළ යන්නේ නම්, මුදල් කොමිෂන් සභාවේද, ඇස්තමේන්තුගත මුදල වෙනස් නොවන්නේ නම්, ප්‍රධාන ලේකම් හෝ ප්‍රධාන ලේකම් විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුගේද අනුමැතිය ලබා ගත යුතු වේ.

සියලු ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීම, එම වැඩ පරීක්ෂා කිරීම හා ගෙවීම් සඳහා නිර්දේශ කිරීම සඳහා නිලධාරීන් තිදෙනෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එසේම, ලබා දෙන ප්‍රතිපාදන ගොඩනැගිලි විශාල සංඛ්‍යාවක් ඉදි කිරීම සඳහා බෙදා දී, එම ගොඩනැගිලිවල කොටස් නිම කරනු වෙනුවට වර්ෂය තුළ ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රමුඛතාවය මත තෝරා ගත් ගොඩනැගිලි සඳහා වෙන් කොට එම වර්ෂය තුළම ඒවා නිම කිරීමට ක්‍රියා කළ යුතුය.

**ගොඩනැගිලි ඉදිකිරීමේදී සැලකිලිමත් විය යුතු පොදු කරුණු:**

i. ඉදිකරනු ලබන ගොඩනැගිලිවලින් මහජනතාවට සැපයීමට අපේක්ෂිත සේවාව පිළිබඳව සැලසුම්කරණයේ දි මනාව අධ්‍යයනය කළ යුතු අතර, එම සේවාවන් සැපයීම සඳහා අත්‍යාවශ්‍ය අංග පමණක් සැලසුමට ඇතුළත් කළ යුතුය. සේවාවන් ලබාගැනීමට පැමිණෙන මහජනතාවට පහසුවන පරිදි හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමට හැකිවන පරිදි ගොඩනැගිලි සැලසුම් කළ යුතුය.

ii. දැනට පළාත් තුළ පවතින භාවිතයට නොගන්නා ගොඩනැගිලි පිළිබඳව අධ්‍යයනයක් කර, එම ගොඩනැගිලි ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යෙදවීමට පියවර ගත යුතුය. තවද, නව ගොඩනැගිලි ඉදිකිරීමට පෙර දැනට ඉදිකරමින් පවතින හා අතරමග වැඩ නවතා ඇති ගොඩනැගිලිවල වැඩ අවසන් කිරීමට පියවර ගත යුතුය.

iii. ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් කිරීමට සමගාමීවම එම ගොඩනැගිලි භාවිතයට ගැනීමට අත්‍යාවශ්‍ය අනිකුත් යටිතල පහසුකම්, උපකරණ හා මානව සම්පත් පිළිබඳව විශ්ලේෂණයන් සිදුකර ඒ සම්බන්ධයෙන් තොරතුරු හා වියදම් ඇස්තමේන්තු ව්‍යාපෘති වාර්තාවලට ඇතුළත් කළ යුතු අතර, එමගින් ගොඩනැගිල්ල භාවිතය සඳහා යොදා ගැනීමට ක්‍රියා කළ යුතුය.

iv. පාසැල්, රෝහල් හෝ අනිකුත් රජයේ පොදු ගොඩනැගිලි හා පිට්ටනි වටා තාප්ප ඉදිකිරීමට ප්‍රතිපාදන වෙන් නොකළ යුතුය. පාසැල් කාලයෙන් පසු පාසැල්වල ක්‍රීඩා භූමි හා අනිකුත් පොදු ක්‍රීඩා භූමි අදාල ආයතනවල අනුමැතිය ලබා ගෙන මහජනතාවට ක්‍රීඩා කටයුතු හා ව්‍යායාම කටයුතු සඳහා භාවිතයට ගැනිමට හැකිවන පරිදි විවෘතව තැබිය යුතුය.

v. කාර්යාල ගොඩනැගිලිවල විදුලි ආලෝකය සහ වායු සමීකරණ අවම ලෙස භාවිත කිරීමට හැකි වන පරිදි එම ගොඩනැගිලි ඉදිකිරීමේ දී මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සැලසුම් කළ යුතුය.

vi. මහල් ගොඩනැගිලි තැනීමේදි හැකි උපරිමයෙන් මහල් දෙකකට හෝ තුනකට සීමා වන පරිදි එම ගොඩනැගිලි ඉදි කළ යුතු අතර, විදුලි සෝපාන සවි කිරීම අවම කළ යුතුය. එසේ වුවද, සේවාවන් ලබා ගැනීම පිණිස පැමිණෙන ආබාධිත පුද්ගලයින්ට ගොඩනැගිලිවලට පිවිසීමට හා අවශ්‍ය සේවාවන් ලබා ගැනීමට හැකිවන අයුරින් ඒවා සැලසුම් කළ යුතුය.

vii. නිලධාරින් සඳහා නිල නිවාස ඉදිකිරීමේදි ගරාජයන්, ආලින්ද හා අනෙකුත් අත්‍යවශ්‍ය කොටස් ඇතුළත්ව මාණ්ඩලික නිලධාරින් සඳහා ඉදි කරනු ලබන නිල නිවසක් වර්ග අඩි 1,750 ක් ද සෙසු නිලධාරින් සඳහා ඉදි කරනු ලබන නිල නිවසක් වර්ග අඩි 1,200 ක් ද නොඉක්ම විය යුතු වේ. නිල නිවාස ඉදිකිරීමේදි දැනට පවතින සැලසුම් (Type Plan) වර්තමාන අවශ්‍යතාවයන්ට නොගැලපෙන හා ප්‍රමාණයෙන් ඉතා විශාල බව නිරීක්ෂණය වේ. එබැවින් ඉහත වර්ග අඩි ප්‍රමාණයන් තුළ නිල නිවාස ඉදිකිරිම සඳහා සැලසුම් සකස්කර ගත යුතුය. තවද, පවත්නා ඉඩම් ප්‍රශස්ත ලෙස භාවිතා කිරිම උදෙසා දෙමහල් නිල නිවාස සැලසුම් කිරීම වඩාත් යෝග්‍ය වේ.

### 1.2 මාර්ග ඉදි කිරීම

මාර්ග ඉදි කිරීමේදී කොන්ක්‍රීට් හෝ තාර දැමීමට කටයුතු කළ යුතු වේ. එසේම, මාර්ගයේ පැවැත්මට බලපාන බෝක්කු, පාලම්, පැති බැම් හා පැති කාණු ආදිය ඉදි නොකර මාර්ග ඉදි කිරීම නොකළ යුතුය. ග්‍රාමීය නිෂ්පාදන වෙළඳපොළ වෙත ප්‍රවාහනය කිරීම හා අනෙකුත් සේවාවන් ලබා ගැනීම සඳහා නගරවලට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වන පරිදි පළාත් සභා හා පළාත් පාලන මාර්ග A හා B මාර්ග සමග සම්බන්ධ කළ යුතුය. මාර්ග අබලන් වීම වැළැක්වීම සඳහා මාර්ග ඉදි කරන අවස්ථාවේම නිරන්තර නඩත්තුව සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතුය.

### 1.3 කුඩා වැව් හා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය

කුඩා වැව් හා සුළු වාරිමාර්ග සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය සඳහා ආයෝජනය කිරීමේදී අදාල ජලාශය හා ජලාශයේ සිට ගොවිපල භූමිය දක්වා ජල සැපයුමට අත්‍යවශ්‍ය සෑම අංගයක් පිළිබඳවම අධ්‍යයනයෙන් පසු, ජලය රැස් කර තබා ගැනීම හා ගොවිපලවල් සඳහා ජල සැපයුම ගෙන යාමට අවශ්‍ය අදාල සෑම අංගයක්ම මනාව ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන කටයුතු සඳහා ආයෝජනය කළ යුතුය. එසේ නොමැතිව වාරි ව්‍යාපෘති සංඛ්‍යාත්මකව විශාල ප්‍රමාණයක් උදෙසා ඵලදායී නොවන අයුරින් ආයෝජනය සිදු නොකළ

යුතුය. කුඩා වැව් හා සුළුවාරිමාර්ග සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය සඳහා ගොවි සංවිධානවල සහභාගිත්වය සහ දායකත්වය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

**2. ලියාපදිංචි සමිති සඳහා ඍජු කොන්ත්‍රාත් පිරිනැමීම හා පළාත තුළ සීමිත ටෙන්ඩර් කැඳවීම**

වරින් වර නිකුත් කරනු ලබන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි පනවන ලද සීමාවන් නොඉක්මවන පරිදි පළාතට ගැලපෙන සීමාවන් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් හා අදාල නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක නිර්දේශයෙන් හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් තීරණය කළ යුතු වේ. කොන්ත්‍රාත් පිරිනැමීමේදී ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව කටයුතු කළ යුතු වේ.

**3. ඉදිකිරීම් පිළිබඳව අදාල ආයතන ප්‍රධානියා දැනුවත් කිරීම හා ඉදිකිරීම් පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරීම**

කිසියම් ටෙන්ඩරයක් ප්‍රදානය කළ පසු ගිවිසුමට අදාල ඇස්තමේන්තුව හා ඒ අනුව සිදුකළ යුතු වැඩ ලැයිස්තුව අදාල ආයතනයේ ප්‍රධානියා (උදා: පාසල් ගොඩනැගිල්ලක් නම් පාසලේ විදුහල්පති, රෝහලේ ගොඩනැගිල්ලක් නම් අදාල රෝහලේ ප්‍රධානියා) වෙත ලබා දිය යුතුය. සෑම ඉදිකිරීමකදීම තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී අදාල ආයතනයේ ප්‍රධානියා සම්බන්ධ කරගත යුතුය. ඇස්තමේන්තු හා වැඩ ලැයිස්තු ආදී පිටපත් ආයතන ප්‍රධානියාට ලබා දී අධීක්ෂණ ක්‍රියාවලියට සම්බන්ධ කරගත යුතුය. අවසන් ගෙවීම් සිදුකිරීමට පෙර අදාල ආයතනයේ ප්‍රධානියාගෙන් වැඩ පිළිබඳව සෑහීමකට පත්වන බවට නිර්දේශයක් ලබා ගත යුතු වේ.

මාර්ග හා ගොඩනැගිලි ඇතුළු සෑම ඉදිකිරීමකම කොන්ත්‍රාත්කරුගේ නම, අධීක්ෂණ නිලධාරීන්ගේ නම්, ගිවිසුම්ගත මුදල, නිම කිරීමට අපේක්ෂිත වැඩ ලැයිස්තුව, ගිවිසුම්ගත කාලය ඇතුලත් තොරතුරු ප්‍රතිලාභීන්ට මනාව අධ්‍යයනය කළ හැකි පරිදි ඉදිකිරීම් භූමියේ ප්‍රදර්ශනය කළ යුතුය. ඒ අනුව, ඉදිකිරීම්වල ගුණාත්මකභාවය අධීක්ෂණය සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන ප්‍රතිලාභීන්ට අවස්ථාව ලබා දිය යුතුය. තවද, ඉදි කිරීම් සම්බන්ධයෙන් ගැටළු ඇත්නම්, ඒ පිළිබඳව දැනුම් දීම සඳහා නිලධාරියෙකුගේ නම හා දුරකථන අංකයද ප්‍රදර්ශණය කළ යුතුය. එවැනි තොරතුරු අදාල ආයතනයේ වෙබ් අඩවියට ඇතුළත් කිරීමට ක්‍රියා කළ යුතු වේ.

**4. භාණ්ඩ මිළදී ගැනීමේදි සැලකිලිමත් විය යුතු පොදු කරුණු**

වෛද්‍ය උපකරණ ඇතුලු සියලු උපකරණ මිලදී ගැනීමේදි අවශ්‍යතා ප්‍රමුඛතාගත කළ යුතු අතර, දැනට පවතින උපකරණ හා ඒවායේ වර්තමාන තත්වය පිළිබඳව මනා අධ්‍යයනයක් සිදු කොට එම උපකරණ ප්‍රශස්ත ලෙස භාවිතයේ යෙදවීමෙන් පසු නව උපකරණ මිලදී ගැනීමට යෝජනා ඉදිරිපත් කළ යුතුය. මිලදී ගනු ලැබීමට අපේක්ෂිත උපකරණ භාවිතා කිරීම සඳහා අවශ්‍ය දැනුම, ඵලදායී භාවිතය සඳහා අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලය හා ඒවා ස්ථාපිත කිරිම සඳහා අවශ්‍ය අනිකුත් යටිතල පහසුකම් පිළිබඳව සැලකිලිමත් විය යුතුය. මිලදී ගනු ලබන උපකරණ නඩත්තු කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් මිලදී ගනු ලබන අවස්ථාවේදීම සකසා ගත යුතුවේ.

## 5. වාහන මිළදී ගැනීම

වාහන මිලදී ගැනීමේදි ඒ පිළිබඳව මහා භාණ්ඩාගාරය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුගමනය කළ යුතුය. ඒ පිළිබඳව මහා භාණ්ඩාගාරයේ හා මුදල් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ. භාවිතයට නොගන්නා වාහන රජය පිළිගත් ක්‍රමවේදයන් තුළ වාර්ෂිකව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. ඉන් ලැබෙන ආදායම පළාත් අරමුදලට බැර කළ යුතුය.

## 6. සෘජු ප්‍රදාන ලබා දීම

වාර්ෂික සංවර්ධන සැලසුම් තුළ ඇතුළත්ව ඇති සෘජු ප්‍රදාන (මන්ත්‍රී ප්‍රතිපාදනයන් යටතේ දක්වා ඇති විශේෂ විධිවිධානයන් හැර) එක් එක් පුද්ගලයාට හෝ පවුල් ඒකකයට පෞද්ගලික වන සේ ලබා දීමේදී සෘජු ප්‍රදානයේ වටිනාකමින් අවම වශයෙන් 50%ක ප්‍රතිලාභී දායකත්වයක් ලබා ගත යුතුය. ලියාපදිංචි සමිතිවලට ලබාදෙන සෘජු ප්‍රදාන සඳහා සමිතියේ දායකත්වයේ ප්‍රතිශතය එක් එක් සෘජු ප්‍රදානයේ ස්වභාවය අනුව 40%ක අවමයකට යටත්ව ප්‍රධාන ලේකම් විසින් තීරණය කළ යුතු වේ. ලබා දෙන සියලුම සෘජු ප්‍රදාන ආදායම් උත්පාදනය අරමුණුකර ගෙන ලබාදිය යුතු අතර, පාරිභෝජන ස්වරූපයේ භාණ්ඩ මිළදී ගැනීම සඳහා සෘජු ප්‍රදාන ලබා නොදිය යුතුය. මෙලෙස ලබා දෙන සෘජු ප්‍රදාන උපයෝගී කරගෙන ඉටු කරන ලද ක්‍රියාකාරකම් සහ එමගින් ලබා ගත් ප්‍රතිඵල පිළිබඳව පසු විපරම් කර, වර්ෂය අවසානයේදී ප්‍රගති වාර්තා පිළියෙල කළ යුතුය.

## 7. අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති

අපද්‍රව්‍ය ජනනය වන ස්ථානවලදීම වර්ගීකරණය කිරීම, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, අපද්‍රව්‍ය යොදවා ගෙන කාබනික පොහොර නිෂ්පාදනය හා අනෙකුත් අපද්‍රව්‍ය යොදවා සිදුකරනු ලබන ශක්‍යතාවයෙන් යුත් ව්‍යාපෘති දිරි ගැන්වීම සිදු කළ යුතුය. එසේ වුවද, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන, උපමාන පාදක සංවර්ධන ප්‍රතිපාදන, පළාත් සභා ප්‍රතිපාදන, ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන, ජාතික අමාත්‍යාංශ ප්‍රතිපාදන, විදේශ ව්‍යාපෘති ප්‍රතිපාදන, රාජ්‍ය නොවන සංවිධාන හෝ පෞද්ගලික අංශයේ ප්‍රතිපාදන යොදවා ස්ථාපනය කරනු ලැබූ ඕනෑම ස්වභාවයක අපද්‍රව්‍ය කළමණාකරන ව්‍යාපෘතියක් අවට ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කෙරෙන ක්‍රමවේදයන් අනුගමනය කරමින් ක්‍රියාත්මක කළ යුතුය. අදාල සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳව ඒ අවට ජනතාව මනාව දැනුවත් කර එම ජනතාවගෙන්ද සමන්විත අධීක්ෂණ කමිටුවක් මගින් අදාල ව්‍යාපෘති සෞඛ්‍යාරක්ෂිතව ක්‍රියාත්මක වන බවට තහවුරු කරගත යුතුය.

මෙම කමිටුව අදාල වසමේ ග්‍රාම නිළධාරි, මහජන සෞඛ්‍ය පරීක්ෂක, අවට පූජනීය ස්ථාන ඇත්නම් එහි අධිපතිවරුන්, අවට ගම්වාසීන් අවම වශයෙන් පස් දෙනෙකුගෙන් හා පළාත් සභාව තීරණය කරනු ලබන අනිකුත් නිලධාරින්ගෙන් සමන්විත විය යුතු අතර, අවම වශයෙන් මාස තුනකට වරක් අදාල ව්‍යාපෘති පිළිබඳව අධීක්ෂණ හා ඇගයුම් වාර්තාවක් පළාත් සභාවේ හා ප්‍රාදේශීය සභාවල අදාල බලධාරීන් විසින් මෙම අධීක්ෂණ කමිටුවෙන් ලබාගත යුතු අතර, එම වාර්තාවල දැක්වෙන කරුණු පිළිබඳව වහාම ක්‍රියාත්මක විය යුතු යුතුය. තවද, අදාල ව්‍යාපෘතිය පවත්වා ගෙන යෑම සඳහා හා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීමේදී ඉහත අධීක්ෂණ කමිටුවේ නිර්දේශද ලබා ගත යුතුය.

## 8. උපමාන පාදක ප්‍රදානයන් යටතේ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ලබා දෙන ප්‍රතිපාදන වියදම් කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග

පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ලබා දෙන මන්ත්‍රී ප්‍රතිපාදන වියදම් කිරීමේදී පළාත් සභා විසින් පහත ප්‍රතිශතයන් අනුගමනය කළ යුතුය.

| | |
|---|---|
| ස්වයං රැකියා ස්ථාපනය | 25% |
| ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය | 25% |
| සමාජ යටිතල පහසුකම් සංවර්ධනය | 30% |
| වාරිමාර්ග හා කෘෂි කර්මාන්ත සංවර්ධනය | 10% |
| ආගමික, සංස්කෘතික හා ක්‍රීඩා සංවර්ධනය | 10% |
| **එකතුව** | **100%** |

### 8.1 ස්වයං රැකියා ස්ථාපනය - 25%

මන්ත්‍රී ප්‍රතිපාදනයෙන් 25% ක් යොදවා මේ යටතේ ආධාර ලබා දිය හැක්කේ ස්වයං රැකියාවක් ලෙස ව්‍යවසායන් ආරම්භ කිරීමට හෝ ආරම්භ කර ඇති ව්‍යවසායන් වැඩිදියුණු කිරීමට අපේක්ෂිත පුද්ගලයින්ට ඒ සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම උදෙසා හා පහත k හා l යටතේ පුහුණු ගාස්තු උදෙසා සෘජු ප්‍රදාන ලබා දීමටයි. සෑම ව්‍යාපෘතියක් සඳහාම ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කළ යුතුය. ඒ සඳහා පළාත් සභාවේ අදාල විෂය භාර දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් හෝ පළාත් සැලසුම් අංශයෙන් නිර්දේශ ලබා ගත යුතුය. ලබාගත් ආධාර ඵලදායි ලෙස පරිහරණය කර ව්‍යවසාය පවත්වාගෙන යන බවට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා හා පළාත් සැලසුම් අංශය විසින් පසු විපරම් කළ යුතුය.

මේ යටතේ පහත සඳහන් ව්‍යවසායන් සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම හෝ පුහුණු සඳහා සෘජු ප්‍රදාන ලබා දිය යුතුය.

a. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය
b. විදුලි උපකරණ අළුත්වැඩියා, වාහන අළුත්වැඩියා සහ පෑස්සුම්
c. ඇඟළුම් කර්මාන්තය
d. රූපලාවන්‍ය හා කොණ්ඩා සැකසුම්
e. ආහාර හා කුළුබඩු ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන
f. විසිතුරු භාණ්ඩ හා අත්කම් නිෂ්පාදන
g. කොහු කර්මාන්ත
h. මිරිදිය ධීවර කර්මාන්තය (ඔරු හා ධීවර ආම්පන්න)
i. සත්ව පාලනය
j. ආබාධිත පුද්ගලයින්ගේ වෙළඳාම් කටයුතු
k. රැකියා ඉලක්ක කරගත් බර වාහන හා යන්ත්‍රෝපකරණ මෙහෙයවීම පිළිබඳ පුහුණුව
l. රැකියා ඉලක්ක කර ගත් විදේශ භාෂා පුහුණුව

ඉහත ව්‍යවසායන් යටතේ ස්වයං රැකියාවක් සඳහා අවශ්‍ය උපකරණ කට්ටල් ලබා ගැනීමට යන වියදමින් 80% ක් හෝ එයට අඩු ප්‍රතිශතයක් සෘජු ප්‍රදානයක් වශයෙන් ලබා දිය හැකි අතර, ඒ සඳහා මන්ත්‍රී ප්‍රතිපාදනයේ දායකත්වයේ උපරිම මුදල රු.40,000/- කි. උපකරණ සඳහා අවශ්‍ය මුදල රු.40,000/- කට වැඩි වන අවස්ථාවකදී ඉතිරි මුදල ප්‍රතිලාභියා විසින් සපයාගෙන ඇති බවට තහවුරු වූ පසු එකඟ වූ ආධාර මුදල නිදහස් කළ යුතුය. ප්‍රතිලාභීන් විසින් යෙදවිය යුතු කොටස යොදවන බවට ද සහතික විය යුතුය.

එක් එක් ප්‍රතිලාභියාගේ ආර්ථික මට්ටම සැලකිල්ලට ගෙන ප්‍රතිලාභියා විසින් දැරිය යුතු ප්‍රතිශතය 20%ක අවමයකට යටත්ව නියම කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් වන විධිවිධාන ප්‍රධාන ලේකම් විසින් හඳුන්වා දිය යුතුය. බර වාහන හා යන්ත්‍රෝපකරණ මෙහෙයවීම සඳහා පිළිගත් ලියාපදිංචි ආයතනවලින් පුහුණුව ලැබිය යුතු අතර, ඒ සඳහා රු.10,000ක උපරිමයක්ද රැකියා ඉලක්ක කරගත් විදේශ භාෂා පුහුණුව සඳහා රු.9,000ක උපරිමයකටද යටත්ව ආධාර ලබා දිය හැක. එම ආයතනවලින් ලබා දෙන පුහුණුව NVQ සහතික සමග ගලපා ගැනීමට කටයුතු කළ යුතුය.

වෙනත් ප්‍රතිලාභී ක්‍රමයකින් ආවරණය නොවූ හා මීට පෙර මෙවැනි ආධාරයක් ලැබී නොමැති අය මේ සඳහා තෝරා ගත යුතුය. මෙම ආධාර ලබා දීමේදී පහත අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දැක්විය යුතුය.

1. අවු.18ත් 35ත් අතර සිටින තරුණ තරුණියන්
2. වැන්දඹුවන්
3. ආබාධිත පුද්ගලයින්

තවද ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී අදාල ව්‍යවසාය ආරම්භ කිරීම සඳහා අත්‍යවශ්‍ය උපකරණ මිළදී ගැනීමට අවශ්‍ය මුදල ඉල්ලුම්කරුගේ පෞද්ගලික වත්කම්වලින් දැරිය නොහැකි බවට හා අවශ්‍ය මුදල බැංකු ණය යෝජනා ක්‍රමයක් මගින් ඉල්ලුම්කරුට ලබා ගැනීමට අපහසු බවට බලධාරින් විසින් සෑහීමකට පත් විය යුතු වේ. එමෙන්ම යෝජිත ව්‍යාවසාය සාර්ථකව කර ගෙන යාමේ හැකියාව ප්‍රතිලාභියාට ඇති බවද බලධාරියා විසින් සහතික කරගත යුතුය. ස්වයං රැකියා උදෙසා සංවර්ධන බැංකු මගින් ලබා දෙන සහන ණය ලබා ගැනීමට ප්‍රතිලාභීන් යොමු කිරීමට ද කටයුතු කළ යුතුය.

### 8.2 ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය - 25%

මේ යටතේ මන්ත්‍රී ප්‍රතිපාදනයෙන් 25% ක උපරිමයක් දක්වා පහත කටයුතු සඳහා මුදල් යෙදවිය හැකිය.

#### i. ග්‍රාමීය මාර්ග සංවර්ධනය

ගම තුළ හා ගම් අතර ප්‍රවාහන පහසුකම් සංවර්ධනය කිරීම මෙමගින් සිදු කළ යුතු අතර, ගමේ පොදු ස්ථාන (පාසල, ආගමික ස්ථාන, වෙළඳපළවල්, සෞඛ්‍ය සායන, පොදු ළිං, සොහොන් බිම් වැනි) සඳහා වන ප්‍රවේශ මාර්ග සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු වේ. මාර්ගවල පැති කාණු, පැති බැම්, බෝක්කු හා කුඩා පාලම් (තැලවිලි) ආදිය සංවර්ධනය සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දිය යුතු වේ. කුඩා පාරවල් කොන්ක්‍රීට් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය. පොදු ගමනාගමනය සඳහා අවශ්‍ය පඩිපේළි ඉදි කිරීමද කළ හැකිය. පස් වැඩ තිබේ නම් ප්‍රතිලාභී

දායකත්වය ලබා ගත යුතු අතර, පස් වැඩ සඳහා මෙම මුදල් ලබා නොදිය යුතුය. එසේම, සංවර්ධන සඳහා තෝරා ගනු ලබන මාර්ග, ග්‍රාම සංවර්ධන මාර්ග, කෘෂි මාර්ග හා හුදෙකලා ගම්මාන සංවර්ධනය සඳහා ලබා දෙන ප්‍රතිපාදන යොදවා සංවර්ධනය කරනු ලබන මාර්ග සමග ද්විකරණය නොවිය යුතුය.

**ii. පානීය ජල සැපයුම**

සුදුසු විකල්ප ජල ප්‍රභවයකින් පානීය ජලය ලබා දීම මේ යටතේ සිදු කළ හැකිය. ජල ප්‍රභවයේ යෝග්‍යතාවය පිළිබඳව ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් තහවුරු කරගැනීම කළ යුතුය. ජල ව්‍යාපෘති සඳහා තත්ව පාලන වාර්තාවක් ලබා ගැනීමටද ආධාර ලබා දිය හැකිය. පානීය ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේදී එය භාවිතයට ගත හැකි පරිදි නිම කළ හැකි බවට අදාල බලධාරීන් සෑහීමට පත් විය යුතුය.

**iii. විදුලිය**

අදාල පළාත් අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලබන අවම නිවාස සංඛ්‍යාවක් ඇති ප්‍රදේශවලට විදුලි දිගුවක් ලබා දීම සඳහා ආධාර කළ හැකිය.

**8.3 සමාජ යටිතල පහසුකම් සංවර්ධනය - 30%**

මේ යටතේ මන්ත්‍රී ප්‍රතිපාදනයෙන් 30% ක් යොදවා,

**i. අධ්‍යාපනය**

මේ යටතේ රජයේ පාසල්වල ගොඩනැගිලි අළුත්වැඩියාව, ආරක්ෂිත වැට හා ගේට්ටු ඉදි කිරීම, සනීපාරක්ෂක කටයුතු සහ බීමට ජලය ලබා දීම, ක්‍රීඩා පිටි, ළමා උයන් ඉ දිකිරීම හා සංවර්ධනය සිදු කළ හැකිය. තාප්ප බැඳීම සඳහා මුදල් වෙන් නොකළ යුතුය.

ලියාපදිංචි පෙර පාසල් සඳහා ඩෙස්, පුටු හා අනෙකුත් අත්‍යාවශ්‍ය උපකරණ ලබා දෙන්නේ නම්, උපරිමය රු.20,000/- ක් විය යුතුය. පෙර පාසල්වලට ලබා දෙන උපකරණ ලැයිස්තුව අදාල පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කළ යුතුය. ලබා දෙන උපකරණවල ප්‍රමිතිය පිළිබඳව සහතිකයක් ලබා ගත යුතු අතර, එසේ ලබා දෙන උපකරණවල ලේඛනයක් සකස් කළ යුතුය.

පළාත් පාලන ආයතන/පාසල් පුස්තකාල සඳහා පොත් ලබා දෙන්නේ නම් උපරිම වටිනාකම රු.25,000/-ක් විය යුතු අතර, දැනටමත් ප්‍රමාණවත් පොත් සංඛ්‍යාවක් නොමැති පුස්තකාල සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

අධ්‍යාපනයට ඉතා දක්ෂ එහෙත් පවුලේ ආදායම් මට්ටම ඉතා අඩු වීම නිසා පොත්පත් හා අධ්‍යාපනික උපකරණ මිලදී ගැනීමට අපොහොසත් සිසුන් සඳහා එක් සිසුවෙකුට වසරකට රු.5,000/-ක උපරිමයකට යටත්ව පොත් පත් හා අධ්‍යාපනික උපකරණ ලබා දිය හැකිය. පවුලේ

ආදායම් තත්වය පිළිබඳව ග්‍රාම නිලධාරිගේ හා අදාල සිසුවාගේ දක්ෂතාවය පිළිබඳව පාසලේ විදුහල්පතිගේ නිර්දේශයෙන් අදාල පන්ති භාර ගුරුවරයාගේ මාර්ගයෙන් අදාල සිසුවාට එම පරිත්‍යාගය සිදු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් පාසලේ අනෙකුත් සිසුන් දැනුවත් නොකළ යුතුය. සිසුන්ට පොදුවේ පොත් පත් හා උපකරණ ලබා දීම සිදු නොකළ යුතුය.

**ii. සෞඛ්‍යය (බටහිර හා ආයුර්වේද)**

බටහිර හා ආයුර්වේද සෞඛ්‍ය සංවර්ධනය උදෙසා ප්‍රතිපාදන යොදවන්නේ නම්, ග්‍රාමීය සායනවල ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම, ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කළ හැකිය. තවද, ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානවලට අවශ්‍ය පුටු/ බංකු සැපයීම සිදු කළ හැකිය. සපයනු ලබන භාණ්ඩ අදාල සෞඛ්‍ය මධ්‍යස්ථානයේ බඩු වට්ටෝරු පොතට ඇතුළත් කළ යුතුය.

තවද, දුගී බවින් පෙලෙන පවුල්වල ආබාධිත පුද්ගලයින්ට විශේෂයෙන්ම දරුවන්ට රු.35,000/-ක උපරිමයකට යටත්ව ඔවුන්ගේ දෛනික ජීවිතය පහසු කරවන විශේෂිත උපකරණ ලබා දිය හැකිය. මෙම උපකරණ ඔවුන්ගේ ආබාධිත තත්වය අඩුකරලීමට උපකාර වන විශේෂිත උපකරණ විය යුතුය. සමාජ සේවා අධ්‍යක්ෂගේ අනුමැතියෙන් උපකරණ ලබා දිය යුතු අතර, උපකරණයක වටිනාකම රු.15,000/- ඉක්මවන අවස්ථාවලදී අදාල පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු වේ.

**iii. නිවාස**

නිවසක ඉදි කිරීම් කටයුතු සඳහා එක් ප්‍රතිලාභී පවුලකට රුපියල් 40,000/-ක උපරිමයකට යටත්ව ආධාර මුදලක් ලබා දිය හැකිය. ප්‍රතිලාභියා විසින් පදිංචියට සුදුසු අයුරින් නිවස සාදා ගන්නා බවට පසු විපරම් කළ යුතුය. එසේම, ප්‍රතිලාභී දායකත්වය ස්වයං උපකාරක ප්‍රවේශ (Aided self-help Approach) ක්‍රමයට ලබා ගත යුතුය. තවද, නිවාස අමාත්‍යාංශයේ වැඩපිළිවෙල සමග ද්විකරණය නොවිය යුතුය.

තවද, පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සිටින නිවාසවලට විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට එක් ප්‍රතිලාභී පවුලකට රු.15,000/-ක උපරිමයකට යටත්ව ආධාරයක් ලබා දිය හැකිය. නිවසකට විදුලිය ලබා ගැනීම උදෙසා ලබා දෙන ආධාර මුදල ගෙවිය යුත්තේ විදුලි බලය සපයනු ලබන ආයතනයටයි.

ඉහත ආධාර සඳහා හිමිකම් ඇත්තේ පහත සඳහන් එක් කරුණක් හෝ සපුරනපවුල් වලට පමණි.

i දිළිඳු සහනාධාරලාභියෙකු වීම.
ii පවුලේ ආදායම උපයන්නා මිය යාම නිසා අසරණභාවයට පත්ව සිටීම.
iii ගෘහ මූලිකයා කාන්තාවක් වන අඩු ආදායම් ලාභී පවුලක් වීම.

**iv. ග්‍රාම සංවර්ධන කටයුතු**

පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා සෑහීමට පත්වන වසර 2කට වඩා වැඩි කාලයක් පවත්වාගෙන යන දැනට අවශ්‍යතාවයන්ට ප්‍රමාණවත් පරිදි පුටු හා වකරන් මඩු නොමැති මරණාධාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති සඳහා වසර 4ක් ඇතුළත එවැනි ආධාරයක් ලබා දී නොමැති සමිතියකට රු.30,000/-ක උපරිමයකට යටත්ව පුටු සහ වකරන් මඩු ලබා දිය හැකිය. එම උපකරණ පොදු සුබසාධන කටයුතු සඳහා භාවිතා කළ යුතු අතර, අදාල ආයතනයේ තොග පොතට ඇතුළත් කළ යුතුය. ඉහත භාණ්ඩ ලබා දීමේදී අදාල ප්‍රාදේශීය ලේකම්ගේ හෝ පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ හා සම්බන්ධීකරණය ලබා ගත යුතු අතර, විධිමත් පරිදි භාණ්ඩ භාරදී ලේඛණගත කිරීම කළ යුතුය.

තවද පාසල්, වෛද්‍ය සායන, ඩිස්පෙන්සරි හා ග්‍රාම සංවර්ධන ශාලා වැනි පොදු ස්ථානවලට රුපියල් 30,000/- ක උපරිමයකට යටත්ව විදුලිය ලබා දිය හැකිය. එවැනි අවස්ථාවලදී විදුලි බලය සපයන ආයතනයට මුදල් ගෙවිය යුතුය.

තවද, මේ යටතේ මහජන සනීපාරක්ෂාවට බලපාන පොදු ලිං අළුත්වැඩියා හෝ ඉදිකිරීම හා එම ලිංවල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය සඳහා රු.25,000/-ක උපරිමයකට යටත්ව ආධාර ලබා දිය හැකිය. මේ සඳහා ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීම අනිවාර්ය වේ.

## 8.4 වාරිමාර්ග හා කෘෂි කර්මාන්ත සංවර්ධනය - 10%

මේ යටතේ මන්ත්‍රී ප්‍රතිපාදනයෙන් 10%ක මුදලක් යොදවා,

**i. වාරිමාර්ග**

වැව් හෝ ජලාශ හැර වෙනත් කුඩා වාර්මාර්ග ඉදි කිරීම, ප්‍රතිසංස්කරණය, ඇල වේලි ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය මේ යටතේ සිදු කළ හැකිය. මෙයට අමතරව පොදු කෘෂි ලිං ඉදි කිරීම සඳහා ආධාර ලබා දිය හැකිය. මෙම කටයුතු සඳහා ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීම අනිවාර්ය අතර, එක් ව්‍යාපෘතියක් සඳහා මන්ත්‍රී ප්‍රතිපාදනයෙන් යෙදවිය හැකි උපරිමය රුපියල් 40,000/- කි.

**ii. කෘෂි කර්මාන්ත**

කෘෂි ආම්පන්න ලබා දෙන්නේ නම් ඒවා ලබා දිය යුත්තේ ලියාපදිංචි ගොවි සංවිධානවලටයි. ගොවි සංවිධානයකට ලබාදිය හැකි කෘෂි ආම්පන්නවල වටිනාකම උපරිමය රු.50,000/- කි. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂගෙන් හෝ ප්‍රධාන ලේකම් විසින් තීරණය කරනු ලබන නිලධාරියෙකුගෙන් ලබා ගනු ලබන නිර්දේශ පදනම් කරගෙන භාණ්ඩ ලබා දිය යුතු අතර, එය ගොවි සංවිධානයේ බඩු වට්ටෝරු පොතට ඇතුලත් කිරීමට වග බලා ගත යුතුය.

ගොවි සංවිධානයට ලබා දෙන භාණ්ඩ පොදුවේ ගොවීන් අතර භාවිතා කළ හැකි ස්වරූපයේ භාණ්ඩ විය යුතු අතර, තනි තනි ගොවියාට භාවිතය සීමා වන සේ භාණ්ඩ නිකුත් නොකළ යුතුය. තවද,

මෙයට පෙර අදාල ගොවි සංවිධානයට ලබා දී ඇති උපකරණ හා ආම්පන්න පිළිබඳව හා ඒවායේ භාවිතය පිළිබඳව ඇගයීමක්ද සිදු කළ යුතුය.

ආර්ථික, සමාජ යටිතල පහසුකම් හා වාරිමාර්ග හා කෘෂිකර්මාන්ත සංවර්ධනය සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන යෙදවීමේදී මෙම ක්‍රියාකාරකම්වලින් ප්‍රතිලාභ ලබන අවම ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාවන් අදාල විෂයය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් තීරණය කර අවශ්‍ය නිර්ණායක ලබා දිය යුතුය.

**8.4 ආගමික, සංස්කෘතික සහ ක්‍රීඩා සංවර්ධනය - 10%**

මේ යටතේ මන්ත්‍රී ප්‍රතිපාදනයෙන් 10%ක මුදලක් යොදවා,

**i. ආගමික හා සංස්කෘතික කටයුතු**

මේ යටතේ ආගමික හා සංස්කෘතික උත්සව සඳහා හා පාරම්පරික නැටුම් කණ්ඩායම් හා කලා කටයුතු සංරක්ෂණය කිරීම සඳහා ආධාර ලබා දිය හැකිය. ඒ සම්බන්ධයෙන් නිර්ණායක හා 10% සීමාව තුළ ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණයන් විෂයය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් පළාතට උචිත අයුරින් පැනවිය යුතුය.

**ii. ක්‍රීඩා සංවර්ධනය**

පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂගේ හා විෂයය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුගේ නිර්දේශය මත ලියාපදිංචි ක්‍රීඩා සමිති සඳහා රු.25,000/- ක උපරිමයකට යටත්ව ක්‍රීඩා භාණ්ඩ ලබා දිය හැක. මෙහිදී, මෙයට පෙර අදාල ක්‍රීඩා සමිතියට ලබා දී ඇති ක්‍රීඩා භාණ්ඩ හා ආම්පන්න පිළිබඳත් ඒවායේ භාවිතය පිළිබඳවත් ඇගයීමක් සිදු කළ යුතුය. දිස්ත්‍රික්, පළාත් හෝ ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අත්‍යවශ්‍ය වන ඇඟළුම් හෝ ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනීම සඳහා එක් ක්‍රීඩකයෙකුට දිස්ත්‍රික් මට්ටමේ තරඟ සඳහා රු.3,000/- ක්, පළාත් මට්ටමේ තරඟ සඳහා රු.5,000/- ක් හා ජාතික මට්ටමේ තරග සඳහා රු.7,500/- ක් වශයෙන් උපරිමයන්ට යටත්ව සෘජු ආධාර ලබා දීමද සිදුකළ හැකිය. තවද ලියාපදිංචි ක්‍රීඩා සමිති මගින් පවත්වනු ලබන ක්‍රීඩා උත්සව සඳහා රු.5,000/- උපරිමයකට යටත්ව ආධාර ලබා දිය හැකිය.

උපමාන පාදක ප්‍රදාන යටතේ මන්ත්‍රී ප්‍රතිපාදන උදෙසා මෙම චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් ඒ ඒ පළාත් සභාවේ අදාල අමාත්‍යාංශ ලේකම් විසින් සකස් කර අදාල බලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතු වේ. උදාහරණ ලෙස,

- සෘජු ප්‍රදානයන්වලදී මුදල් හෝ භාණ්ඩ ලබා දෙන ආකාරය පිළිබඳ විධිවිධානයන්.
- ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල සිටිය යුතු අවම ප්‍රතිලාභීන් සංඛ්‍යාව.
- භාණ්ඩ ලබා දීමේදී එම භාණ්ඩවල ස්වරූපය, වර්ග හා ඒවායේ ප්‍රමිතිය පිළිබඳව.
- ව්‍යාපෘතීන් තෝරා ගැනීම පිළිබඳව විධි විධාන.

## 9. පරිපාලන වියදම්

ප්‍රාග්ධන වියදම් සඳහා පළාත් සභාව විසින් වෙන් කරනු ලබන කිසිදු ප්‍රතිපාදනයකින් පරිපාලන වියදම් සඳහා මුදල් වෙන් නොකළ යුතුය. මේ පිළිබඳව මා විසින් එවන ලද අංක FC/3/3/2014 දරන 2014.12.31 දිනැති ලිපියෙන් ලබා දී ඇති උපදෙස් තව දුරටත් බල පැවැත්වේ.

මෙම චක්‍රලේඛය පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුලු දේශපාලන නායකත්වය, සියලුම පළාත් අමාත්‍යාංශවල ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හා අදාල අනෙකුත් නිලධාරීන් මනාව දැනුවත් කර, 2015 අප්‍රේල් 01 වන දින සිට මෙම චක්‍රලේඛයට අනුව කටයුතු කරන මෙන් ඉතා කාරුණිකව දන්වමි.

ඩබ්.එච්.මුණසිංහ
ලේකම්
මුදල් කොමිෂන් සභාව

පිටපත්:

1. ගරු ආණ්ඩුකාරතුමා - සියලුම පළාත්
2. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
3. ලේකම්, මුදල් අමාත්‍යාංශය
4. ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
5. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) - සියලුම පළාත්
6. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - සියලුම පළාත්
7. සහකාර විගණකාධිපතිවරු - සියලුම පළාත්